# දෑ අවුරුදු පිරිවෙන් ගුරු පුහුණු පාඨමාලාව

# පාඨමාලා අත්පොත

## (2025/2027 අධ්‍යයන වර්ෂය සඳහා)

**සීතාවකපුර පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනය**
අළුබෝදල පාර - ඉහළ කොස්ගම
කොස්ගම
දූරකථනය හා ෆැක්ස් :- 0362250702
ඊ-මේල් :- spttinstitute@gmail.com

## දැක්ම

වෘත්තීයමය

හා

අවැසි කාලීන

ගුරු නිපුණතාවන්ගෙන්

පිරිපුන්

පිරිවෙන්

ගුරු පරපුරක්

## මෙහෙවර

ත්‍රිවිධ ශාසනය ප්‍රගුණ කරන,
ඉගෙනුම් - ඉගැන්වීම්
ක්‍රියාවලියේදී දැනුම,
ආකල්ප, කුසලතා හා
නිපුණතාවන්ගෙන් සුසැදි,
ආදර්ශවත් ගුරු
පෞරුෂයන්ගෙන් හෙබි
අභිමානවත් පිරිවෙන් ගුරු
පරපුරක් දැයට දායාද කිරීම.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පිරිවෙන්වල වෘත්තීය පුහුණුවක් ලබා නැති උපාධිධාරී නොවන පරිවේණාචාර්යවරු විශාල සංඛ්‍යාවක් ඉගැන්වීමෙහි නිරත වෙති. ශාස්ත්‍රීය විෂය දැනුම ඇතත් වෘත්තීය පුහුණුවක් ලබා නැති උපාධිධාරී නොවන ගුරුවරුන්ගෙන් ඉගෙනුම ලබන පිරිවෙන් ශිෂ්‍යයාට විෂය දැනුම ලැබුණත් ඉගෙනුම් ක්‍රියාවලියේ උසස් සාඵල්‍ය මට්ටමක් බලාපොරොත්තු විය නොහැක. එහිදී සිසු ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය කෙරෙහි ගුරුවරයාගේ වෘත්තීය පුහුණුව තීරණාත්මක සාධකයක් බවට පත්වෙයි. වෘත්තීය පුහුණුව ලත් ගුරුවරයාට සිසුන්ගේ හැදියා, ලැදියා, රුචි අරුචිකම්, බුද්ධි මට්ටම්, දක්ෂතා, නිපුණතා හඳුනාගෙන ප්‍රියජනක ඵලදායී පංතිකාමර කළමනාකරණය තුළින් උචිත ආධාරක භාවිත කරමින් නව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද භාවිතයට ගැනීමට හැකියාව ලැබේ. මෙනිසා ගුරු භූමිකාවේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට ඔහු ලබන වෘත්තීය පුහුණුව සෘජු දායකත්වයක් සපයයි. තව ද වෘත්තීය පුහුණුව නොලද උපාධිධාරී නොවන පරිවේණාචාර්යවරුන්ගේ පරිවේණාචාර්ය සේවයේ උසස් වීම් ද අහිමි වී ඇත. මෙය තෘප්තිමත් ව පරිවේණාචාර්ය සේවයේ නිරත වීමේ අවස්ථාව උපාධිධාරී නොවන පරිවේණාචාර්යවරුන්ට අහිමිවීම කෙරෙහි හේතු කාරක වී ඇත.

ඉහත දැක්වූ අවාසි සහගත තත්වයෙන් උපාධිධාරී නොවන පරිවේණාචාර්යවරුන් මුදවා ගැනීම සඳහා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව යටතේ ක්‍රියාත්මක සීතාවකපුර පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනයේ දෑ අවුරුදු පිරිවෙන් ගුරු පුහුණු පාඨමාලාව මගින් ක්‍රියාකාරී මෙහෙවරක් ඉටු කරනු ලබයි.

**1.0 පාඨමාලාවේ අරමුණු**

I. වෘත්තීය පුහුණුවක් නොලබා පිරිවෙන් පද්ධතියේ සේවයේ නියුතු උපාධිධාරී නොවන පරිවේණාචාර්යවරුන්ට වෘත්තීය පුහුණුවක් ලබා දීම

II. ශිෂ්‍ය කේන්ද්‍රීය ව ශිෂ්‍යයාට ස්වාධීන ව මෙන් ම කණ්ඩායම් ලෙස සාමූහික ව ඉගෙන ගැනීමට උචිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද භාවිත කළ හැකි වෘත්තීය පුහුණුව සහිත පුහුණු ගුරු පිරිසක් පිරිවෙන් පද්ධතියට දායාද කිරීම

III. ශිෂ්‍ය වර්ධන මට්ටම, බුද්ධි මට්ටම, ශිෂ්‍ය හැකියා, ලැදියා, අවශ්‍යතා, රුචි අරුචිකම් මැනවින් හඳුනාගෙන ඵලදායී ඉගෙනුම් අවස්ථා සැලසුම්කරණය, සංවිධානය, මෙහෙය වීම හා ඇගයීම සඳහා උපාධිධාරී නොවන පුහුණු ගුරුවරුන් සවිබල ගැන්වීම

IV. කාලීන ව සිදු කරන පිරිවෙන් විෂය නිර්දේශ සංශෝධනවලට අනුකූල ව පරිනාමණ ගුරු භූමිකාව තේරුම්

ගෙන අර්ථවත් ව, ඵලදායී ව හා කාර්යක්ෂම ව වෘත්තීය වගකීම් දැරීමට උපාධිධාරී නොවන ගුරුවරුන් පුහුණු කිරීම

V. පුහුණු පරිවේණාචාර්යවරයකු ලෙස වෘත්තිමය අභිමානයෙන් යුතු ව කාර්යක්ෂම ව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ නියුතු ගුරුවරයකු පිරිවෙන් පද්ධතියට එකතු කිරීම

VI. තම පිරිවෙනේ කෘත්‍යාධිකාරි පරිවේණාධිපති, නියෝජ්‍ය පරිවේණාධිපති, ගුරු භවතුන්, ගිහි පැවිදි සිසුන් පිරිවෙන් ප්‍රජාව සමග අන්‍යෝන්‍ය බැඳීමකින් යුතු ධනාත්මක පුද්ගල සබඳතා පවත්වා ගෙන යා හැකි පෞරුෂයක් සහිත ප්‍රියමනාප ගුරුවරයකු පිරිවෙන් පද්ධතියට දායාද කිරීම

## 2.0 පාඨමාලාවට ඇතුළත් වීමට අවශ්‍ය මූලික සුදුසුකම්

I. පරිවේණාචාර්ය සේවයේ 3 ii පත්වීමක් සහිත සේවා කාලය අවුරුදු 3 ට වැඩි පරිවේණාචාර්යවරයකු වීම

II. දෑ අවුරුදු පුහුණු පාඨමාලාව සඳහා කෘත්‍යාධිකාරී හිමියන් විසින් උක්ත ගුරුවරයා පරිවේණාචාර්ය සේවයෙන් නිදහස් කිරීමට හා පාඨමාලාව අවසානයේ නැවත සේවයේ පිහිටු වීමට කැමැත්ත ප්‍රකාශ කිරීම

### 3.0 පාඨමාලාවට තෝරා ගැනීම

අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) හිමිගේ කැඳවීමට අනුව උන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී සම්මුඛ පරීක්ෂණයක් පවත්වා පාඨමාලාව සඳහා සුදුස්සන් තෝරා ගනු ලැබේ.

### 4.0 පාඨමාලාවේ ස්වභාවය

I. දෑ අවුරුදු පූර්ණ කාලීන පාඨමාලාවකි.

II. ලියාපදිංචි වූ වර්ෂයේ සිට නියමිත අධ්‍යයන වර්ෂ 2 ක් තුළ පාඨමාලාව හදාරා අවසන් කළ යුතු ය. එහෙත් ඌණ සාමාර්ථයක් ලත් විට අවුරුදු 5 ක උපරිම කාල සීමාවක් තුළ පාඨමාලාව හදාරා අවසන් කළ යුතු ය.

III. පාඨමාලාව සිංහල මාධ්‍යයෙන් පමණක් ක්‍රියාත්මක වේ.

### 5.0 විෂය මාලාව

විෂය මාලාව ප්‍රධාන විෂය කාණ්ඩ තුනකින් සමන්විත වේ.

01 ශාස්ත්‍රීය විෂය ධාරාව (විශේෂ විෂය)
02 වෘත්තීය අධ්‍යාපන විෂයධාරා
03 පොදු අධ්‍යාපන විෂයධාරාව (සාමාන්‍ය විෂය)

} අනිවාර්ය

**01 ශාස්ත්‍රීය විෂය ධාරාව (විශේෂ විෂය)**

1. ත්‍රිපිටක ධර්මය
2. සිංහල
3. පාලි
4. සංස්කෘත

**02 වෘත්තීය අධ්‍යාපන විෂය ධාරාව**

1. අධ්‍යාපන මනෝ විද්‍යාව
2. අධ්‍යාපන මූල ධර්ම

**03 පොදු අධ්‍යාපන විෂයධාරාව (සාමාන්‍ය විෂය)**

**අනිවාර්යය**

1. ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව
2. ක්‍රියාමූලික පර්යේෂණ නිබන්ධනය (වචන 12000ට නොඅඩු)

**වෛකල්පික**

1. ගණිතය
2. සෞඛ්‍ය අධ්‍යාපනය
3. ඉතිහාසය
4. භූගෝල විද්‍යාව
5. ඉංග්‍රීසි

- **ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව**

ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව සඳහා ඉගැන්වීමේ සාමාන්‍ය ක්‍රම හා ඉගැන්වීමේ විශේෂ ක්‍රම යටතේ දේශනවලින් ලැබෙන සුවිශේෂ න්‍යායික අවබෝධය භාවිත කිරීමේ හැකියාව පිළිබඳ ව ඇගයීමක් බලාපොරොත්තු වේ. පාඩම් සැලසුම් සැකසීම, ඉගෙනුම් උපකරණ සැකසීම හා අභ්‍යන්තර ආදර්ශ පාඩම් සැසි පැවැත්වීම මගින් මූලික පුහුණුවක් ලබා දීම සිදු කෙරේ.

**ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව අදියර දෙකකින් ක්‍රියාත්මක වේ.**

- ඉගැන්වීම් පුහුණු කාලයේ දී රාජකාරී දින සියල්ල ම සේවා ස්ථානයේ වාර්තා විය යුතු ය.
- අත්‍යවශ්‍ය ම කරුණක් සඳහා නිවාඩු ලබා ගන්නේ නම් තෙදිනකටවත් පෙර ඒ සඳහා ලිඛිත අවසරය ලබා ගත යුතු ය. විවේක නිවාඩුවක් නම් වෛද්‍ය සහතිකය ඉදිරිපත් කළ යුතු ය. නිවාඩු ලත් විගස ගුරු අභ්‍යාස ආයතනයට හා සේවා ස්ථානයට දැනුම් දිය යුතු ය.
- වාර සටහන් හා පාඩම් සටහන් විදුහල්පති, පරිවේණාධිපති අංශ ප්‍රධාන ලවා අනුමත කර ගත යුතු ය.

- **ඉගැන්වීම් පුහුණුව - අදියර i ( පාසල)**

ඉගැන්වීම් පුහුණුව අදියර i දෙවන අධ්‍යයන වර්ෂයේ දෙවන වාරයේ පැවැත්වෙන අතර එය සති 06ක කාල සීමාවකින් යුක්ත වේ.

මෙම සති 06 තුළ දී පාසලක දී ගුරු සිසුන්ගේ පන්තිකාමර ඉගැන්වීම අධීක්ෂණයට හා ඇගයීමට ලක් කෙරේ. මේ සඳහා තමන්ට අභිමත 6-11 ශ්‍රේණිවලට අදාළ විෂය දෙකක් තෝරා ගැනීමට ගුරු සිසුන්ට අවසර තිබේ. එක් පංතියකින් එක් විෂයක් පමණක් තෝරා ගත යුතු ය. එක ම විෂයක් තෝරා ගන්නේ නම් පන්ති කිහිපයකින් විය යුතු ය. සමාන්තර පන්තිවල එක ම විෂය ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව සඳහා තෝරා නොගත යුතු ය. ඉගැන්වීම් පුහුණුව සඳහා විෂයයන් 03කට වඩා තෝරා නොගත යුතු ය.

මෙම කාලය තුළ පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනය මගින් පත් කෙරෙන කථිකාචාර්යවරයකු යටතේ අධීක්ෂණයට හා ඇගයීමට ලක් කෙරේ. කාලච්ඡේද 70ක් සඳහා පාඩම් සැලසුම් 70ක් මේ සඳහා ලිවිය යුතු වේ.

**ඉගැන්වීම් පුහුණුව - අදියර ii (පිරිවෙන)**

ඉගැන්වීම් පුහුණුවෙහි දෙවන අදියර දෙවන අධ්‍යයන වර්ෂයේ දෙවන වාරයේ පැවැත්වෙන අතර එය ද සති 06ක කාල සීමාවකින් යුක්ත වේ. මෙම සති 06 තුළ දී පිරිවෙනක දී ගුරු සිසුන්ගේ පන්තිකාමර ඉගැන්වීම අධීක්ෂණයට හා ඇගයීමට ලක් කෙරේ. මේ සඳහා තමන්ට අභිමත ශ්‍රේණිවල විෂය දෙකක් තෝරා ගැනීමට ගුරු සිසුන්ට අවසරය තිබේ.

මෙම කාලය තුළ පිරිවෙන් ගුරු අභ්‍යාස ආතනය මගින් පත් කෙරෙන ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණු පළමු අදියරට සහභාගී නොවූ කථිකාචාර්යවරයකු යටතේ අධීක්ෂණයට හා ඇගයීමට ලක් කෙරේ. කාලච්ඡේද 70ක් සඳහා පාඩම්

සැළසුම් 70ක් මේ සඳහා ලිවිය යුතු වේ. පාසල හා පිරිවෙන සඳහා පාඩම් සැලසුම් 70 බැගින් සැලසුම් 140 ක් ලිවිය යුතු වේ. නියමිත පාඩම් සැලසුම් සංඛ්‍යාව ලිවීමට හා නිර්මාණශීලී ගුණාත්මක යෙදවුම් භාවිතය සඳහා ලකුණු ප්‍රදානය කෙරේ.

- **ක්‍රියා මූලික පර්යේෂණ නිබන්ධය**

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී මුණ ගැසෙන ගැටලුවක් පදනම් කරගෙන ඒ පිළිබඳ ව සොයා බලා එය විසඳීමට ක්‍රියාකාරී ව මැදිහත් වෙමින් විසඳුම් ඉදිරිපත් කරමින් සකස් කළ අධ්‍යයන වාර්තාවක් ඉදිරිපත් කිරීම මේ යටතේ බලාපොරොත්තු වන අතර මෙය පාඨමාලාවේ අනිවාර්ය අංගයක් වේ.

උක්ත කාර්ය සඳහා සෑම ගුරු සිසුවකු සඳහා ම අධීක්ෂක කථිකාචාර්යවරයකු යටතේ අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබා දෙනු ලැබේ. දෙවන වසර දෙවන වාරය අවසන් වීමට ප්‍රථම නිබන්ධයේ කටයුතු අවසන් කළ යුතු ය.

අධීක්ෂකවරයාගේ මගපෙන්වීම යටතේ සකස් කරනු ලබන පර්යේෂණ යෝජනාව ආයතනය මගින් සපයන ආකෘතියට අනුව සකස් කර ඒ සඳහා අනුමැතිය ලබා ගත යුතු ය. අනුමැතිය ලබා ගත් ආකෘති පත්‍රය නිබන්ධ වාර්තාවේ අග ඇතුළත් කළ යුතු අතර අදියරෙන් අදියර අධීක්ෂකවරයාගේ අනුමැතිය එම ආකෘතියේ තිබිය යුතු ය. නියමිත දිනට පෙර නිබන්ධ වාර්තාව භාරදීම අනිවාර්ය වේ. නියමිත දිනට පසු ව ලැබෙන නිබන්ධ සඳහා ප්‍රතිඵල නිකුත් කිරීම පමාවනු ඇත.

**පැවරුම්**

අධ්‍යයන වර්ෂ දෙක තුළ දී ලිඛිත පරීක්ෂණ පැවැත්වෙන සෑම විෂයක් සඳහා ම වාරයකට පැවරුම් 1 බැගින් ලියා නියමිත දිනට පෙර බාර දිය යුතු ය. පැවරුම් සඳහා වාර විභාගයේ දී විෂයයකට දෙනු ලබන මුලු ලකුණු ප්‍රමාණයෙන් 20% ක් ප්‍රදානය කරනු ලැබේ. පැවරුම් භාර දී නොමැති විෂයන් සඳහා ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

**6.0 පාඨමාලාවේ ඇගයීමේ ක්‍රියාවලිය**

පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනය මගින් සිදු කරනු ලබන සම්භවන ඇගයීම හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන සම්පිණ්ඩිත ඇගයීම වශයෙන් පාඨමාලාවේ ඇගයීම කොටස් දෙකකින් සමන්විත වේ. පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනය මගින් වාර 05ක ලිඛිත පරීක්ෂණ පවත්වයි.

එයින් වාර 02ක ලකුණුවල 40%ක ලකුණු ප්‍රතිශතයක් අවසාන සාමාර්ථයට එකතු කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට යවනු ලැබේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන අවසාන ලිඛිත පරීක්ෂණය මගින් 60%ක ලකුණු ප්‍රතිශතයක් අවසාන සාමාර්ථයට එකතු කොට ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ.

**ඇගයීම සිදුවන අයුරු සංක්ෂිප්ත ව**

- සෑම විෂයයක් සඳහා ම වාරයකට නියමිත පැවරුම් එක බැගින් වාර 05කට පැවරුම් 05කි. (පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනයේ විෂයභාර කථිකාචාර්යවරු මගින්)
- පාසල හා පිරිවෙන ලෙස අදියර දෙකකින් ගුරු පුහුණු අධීක්ෂණය
- ක්‍රියාමූල පර්යේෂණ නිබන්ධය ඇගයීම
- අධ්‍යයන වාර 05ක ලිඛිත පරීක්ෂණ පවත්වා ඇගයීම
- දෙවන අධ්‍යයන වර්ෂය අවසානයේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ලිඛිත පරීක්ෂණයක් පවත්වා ඇගයීම

- **සාමාර්ථය ප්‍රදානය කිරීම**

**සමත් විය යුතු විෂයයන් ගණන මෙසේ ය.**

1. ශාස්ත්‍රීය විෂයයන් 04
2. වෘත්තීය අධ්‍යාපන විෂයයන් 02
3. පොදු අධ්‍යාපන විෂයයන්හි අනිවාර්ය විෂයයන් 02
4. වෛකල්පික විෂයයන් 02

- **විෂයයන් සමත්වීමේ ලකුණු ප්‍රමාණය**

සමත් විය යුතු විෂයයන් 9 න් 7 ක් සමත් වී විෂයයන් දෙකක් අසමත් වන අයට ඌණ සාමාර්ථය හිමි වන අතර අසමත් වූ විෂයන්ට නැවත පෙනී සිට ඌණ සාමාර්ථය සම්පූර්ණ කළ යුතු ය.

- **ගණිතය විෂය සමත් වීමේ ලකුණ 30%කි.**
- **සෙසු සියලු ම විෂයයන් සමත් වීමේ ලකුණ 35%කි.**
- **34% සීමාන්තික ලකුණ සේ සලකා සමත් වීම තීරණය කෙරේ.**
- **අභ්‍යන්තර ඉගැන්වීම් පුහුණුව සමත් වීමේ ලකුණ 50%කි.**
- **ඌණ සාමාර්ථය සමත්වීමේ ලකුණ 25%කි.**

**ශ්‍රේණි ප්‍රදානය**

- ලකුණු 0 සිට 33 දක්වා අසමත්
- ගණිතය විෂයට ලකුණු 0 සිට 29 දක්වා අසමත්
- ලකුණු 35 සිට 49 දක්වා සමත්
- ගණිතය විෂයට ලකුණු 30 සිට 49 දක්වා සමත්
- ලකුණු 50 සිට 74 දක්වා - සම්මාන
- ලකුණු 75 සිට 100 දක්වා - විශිෂ්ට

**අභ්‍යන්තර ඉගැන්වීම් පුහුණුව සඳහා ශ්‍රේණි ප්‍රදානය**

- ලකුණු 0 සිට 49 දක්වා අසමත්
- ලකුණු 50 සිට 64 දක්වා සමත්
- ලකුණු 65 සිට 79 දක්වා සම්මාන
- ලකුණු 80 සිට 100 දක්වා විශිෂ්ට

**ගුරු පුහුණු සහතිකය වලංගු වන දිනය**

පාඨමාලාවට ඇතුළත් වූ දින සිට අවුරුදු 02 ක් සම්පූර්ණ වන දිනය යම්කිසි මාසයක 01 වෙනි දින නම් එම දිනය ද එසේ නොමැති නම් ඊළඟ මාසයේ පළමු දිනය ද වේ. ඌණ සාමාර්ථය සම්පූර්ණ කළ අයට පාඨමාලා කාලසීමාව සම්පූර්ණ කර ඇත්නම් එම විභාගය අවසන් වූ වර්ෂයට පසු මාසයේ පළමු දිනය ද සහතිකය වලංගු දිනය වේ.

**පොදු කරුණු හා විනය මාලාව**

I. වාර අවසානයේ පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලැබීම සඳහා එම වාරය තුළ පැවැත්වූ සම්මුඛ සැසිවලින් අවම වශයෙන් 80%ක් සහභාගි වී තිබිය යුතු ය.

II. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන අවසාන ලිඛිත පරීක්ෂණයට පෙර නියමිත පැවරුම් සියල්ල ලියා භාර දී තිබීම, ගුරු පුහුණු අධීක්ෂණ නිම කර තිබීම, ක්‍රියා මූලික පර්යේෂණ නිබන්ධය භාර දී තිබීම අනිවාර්ය වෙයි.

III. සම්මුඛ සැසිවලට සහභාගී වන සෑම දෙනා ම දිනපතා පැමිණීම සහ පිටවීමේ වේලාව යොදා අදාළ ලේඛනයේ අත්සන් කළ යුතු ය. නොපැමිණි කෙනෙකු වෙනුවෙන් වෙනත් අයෙකු අත්සන් යෙදීම බරපතල විනය කැඩීමක් වන අතර එවැනි අය සම්බන්ධයෙන් සුදුසු විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

IV. පෙ.ව. 8.00 සිට 11.30 දක්වාත් ප.ව. 12.45 සිට ප.ව. 5.30 දක්වාත් දිනට නියමිත සම්මුඛ සැසි ක්‍රියාත්මක වන අතර රාත්‍රී 7.00 - 9.00 කාලයේ දී පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. ඒවාට පූර්ණ කාලී ව සහභාගිවීම අනිවාර්ය වෙයි.

V. සම්මුඛ සැසි පැවැත්වෙන කාල සීමාව තුළ නේවාසිකාගාරවල රැඳී නොසිට ඒ සඳහා සහභාගී විය යුතු අතර එම කාලය තුළ අමුත්තන් හමු විය නොහැක.

VI. සම්මුඛ සැසි පැවැත්වෙන කාලය තුළ පිරිවෙන් අභ්‍යාස ආයතනයෙන් බැහැරට යාමට අවසර නැත. විශේෂ අවශ්‍යතාවක් සඳහා පිටව යාමට අවශ්‍ය වුවහොත් ඒ බව අදාළ සටහන් පොතේ බැහැර වන වේලාව, කාරණය හා ස්ථානය. නැවත පැමිණෙන වේලාව සටහන් කොට ආයතනයේ අදාළ බලධරයාගෙන් ලිඛිත අවසරයක් ලබා ගත යුතු ය.

VII. ආයතනයට ඇතුළත් වීමේ දී භාර දෙන ලිපි ලේඛන නැවත ලබා ගත හැක්කේ පාඨමාලා කාලයෙන් පසුව පමණි.

VIII. නේවාසිකත්වය අනුමත කිරීම ආයතනාධිපති හිමියන් සතුයි. නේවාසිකත්වය හිමි කිරීම හෝ අහිමි කිරීම පිළිබඳ අවසන් තීරණය ආයතනාධ්‍යක්ෂක හිමියන් සතුයි.

IX. නේවාසිකත්වය ලබන හිමිවරු හැර වෙනත් ගිහි හෝ පැවිදි අන් කිසිවෙකු කුමණ වේලාවක හෝ කාමරයේ නවතා ගැනීම සපුරා තහනම් ය. ඉන් නේවාසිකත්වය අහිමි විය හැක. අමුත්තන් හමුවීම කාමර තුළ දී සිදු නොකළ යුතු ය.

X. කාමර තුළ ස්ථිර විදුලි උපකරණ හා බඩු බාහිරාදිය අරක්ෂා කළ යුතු අතර විදුලි උපකරණ කාර්යාලයේ අවසරයකින් තොර ව වෙනස් නොකළ යුතු ය.

XI. සෙනසුරාදා, ඉරිදා හා ප්‍රසිද්ධ නිවාඩු දිනවල ආයතනයේ රැඳී සිටින්නේ නම් ආයතනාධ්‍යක්ෂ හිමියන්ගේ අනුමැතිය ලබා ගත යුතු ය.

XII. සති අන්ත නිවාඩුවෙන් පසු සඳුදා උදේ ආයතනයට පැමිණි විට ආයතනාධ්‍යක්ෂ හිමියන් දැනුම්වත් කළ යුතු ය.

XIII. රාත්‍රී 9.00ට පසු ව හා පෙ.ව. 6.00ට පෙර දක්වා කාලය තුළ නේවාසිකාගාරයෙන් පිටවීම හා නේවාසිකාගාරයට පැමිණීම තහනම් වේ.

XIV. සතියකට වඩා නේවාසිකාගාරයේ නොසිටින්නේ නම් තම කාමරයේ දොර යතුරු කාර්යාලයට භාර දිය යුතු අතර තමන් සතු උපකරණ කාමරයේ තබා නොයා යුතු ය.

XV. උදේ හා හවස වත් පිළිවෙත්වල යෙදිය යුතු ය.

XVI. ගුරු විදුහල්/විශ්ව විද්‍යාලය ආදි උසස් අධ්‍යාපන අයතනවල අහාර පාන නොමිළයේ සපයන්නේ නැත. එහෙත් ආයතනාධ්‍යක්ෂ නාහිමියන් වෙත ගුරු ශිෂ්‍ය හිමිවරුන් විශේෂ ඉල්ලීමක් කරන්නේ නම් ආහාර සැපයීමට කාරුණික වනු ඇත.

XVII. පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනයේ නීති රීති සහ සම්ප්‍රදායවලට ගරු කිරීමටත්, ඒවා ආරක්ෂා කිරීමටත් සෑම ගුරු සිසුවකු ම බැඳී සිටියි. ආදර්ශවත් ව හැසිරෙමින් තමාගේ හා ආයතනයේ ගෞරවය ආරක්ෂා වන අන්දමින්

කටයුතු කිරීමට වග බලා ගැනීම සෑම දෙනාගේම පූර්ණ වගකීමක් හා යුතුකමක් වෙයි.

**නිවාඩු**

I. ගුරු සිසුන් ලබා ගන්නා නිවාඩු ආයතනාධිපති හිමි විසින් අදාළ කලාප අධ්‍යාපන කාර්යාලවලට යොමු කරනු ලබයි.
II. පාඨමාලා කාලය තුළ නිල වශයෙන් ප්‍රකාශයට පත් කෙරෙන නිවාඩු දිනයන්ට අමතර ව ලබා ගත හැකි උපරිම අනියම් නිවාඩු දින ගණන දහය (10) කි.
III. අත්‍යවශ්‍ය ම නිවාඩුවක් ලබා ගැනීමේ දී නිවාඩු ඉල්ලුම් පතක් ඉදිරිපත් කොට ආයතනාධිපති හිමිගේ අනුමැතිය ලබා ගත යුතු ය.
IV. අසනීප නිවාඩු ලබා ගන්නේ නම් පිළිගත හැකි වෛද්‍ය සහතිකයක් නිවාඩුවෙන් පසු සතියක් ඇතුළත නිවාඩු ඉල්ලුම් පත්‍රය සමග බාර දිය යුතුය.
V. ගුරු සිසුන් ලබා ගන්නා නිවාඩු ආයතනාධිපති හිමි විසින් මාසික ව අධ්‍යාපන අමාත්‍යාංශයට, කෘත්‍යාධිකාරි හිමිට හා අදාළ කලාප අධ්‍යාපන කාර්යාලයට යොමු කරනු ලබයි.

**උපදේශකත්වය හා අධීක්ෂණය**

අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) පිරිවෙන් අධ්‍යාපන ශාඛාව අධ්‍යාපන අමාත්‍යාංශය

**පාඨමාලාව මෙහෙයවීම**

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව යටතේ පවතින සීතාවක පුර පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනය මගින් පාඨමාලාව ක්‍රියාත්මක කරනු ලැබේ.

**සංවිධානය, පරිපාලනය හා මෙහෙයවීම**

ආයතන අධ්‍යක්ෂ පූජ්‍ය දේවාලේගම සුමංගල ස්වාමීන්ද්‍රයන් වහන්සේ, සීතාවක පුර පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනය, අළුබෝදල පාර, ඉහළ කොස්ගම, කොස්ගම.

ආයතනාධිපති පූජ්‍ය කණම්පැල්ලේ සුමනනන්ද නාහිමිපාණන් වහන්සේ, සීතාවකපුර පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනය අළුබෝදල පාර, ඉහළ කොස්ගම, කොස්ගම.

නියෝජ්‍ය ආයතනාධිපති පූජ්‍ය බබුරුගම ධම්මවංස ස්ථවිර ඇතුළු කථිකාචාර්ය මණ්ඩලය

විනය කමිටුව

## විශේෂ සටහන්

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................